සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2016 **10 ශ්‍රේණිය**

மூன்றாம் தவணைப் பரீட்சை **2016** தரம் **10**

Third Term Test 2016 **Grade 10**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I

தகவல் மற்றும் தொடர்பாடல் தொழிநுட்பம் I

Information and Communication Technology I

පැය එකයි

One hour

ஒரு மணித்தியாலம்

1.) පහත සඳහන් ඒවායින් තොරතුරක් නොවන්නේ,

1. ජාතික හැඳුනුම්පත් අංකය.
2. උපන්දිනය.
3. වයස.
4. වර්ගඵලය.

2.) ගුණාත්මක තොරතුරක ලක්ෂණයක් නොවන්නේ,

1. නිරවද්‍යතාවය.
2. පිරිවැය අවම වීම.
3. කාලීන බව.
4. බහුකාර්ය බව.

3.) එදිනෙදා ජීවිතයේදී තොරතුරු තාක්ෂණය භාවිතා වන ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ,

A. විද්‍යුත් නිකර්පන යන්ත්‍රය. (EEG)
B. වෙබ් පාදක ඉගෙනුම. (WBL)
C. ස්වංක්‍රීය ජල සැපයුම.
D. හරිතාගාර.
E. ගුවන් විදුලි සංඥා හැඳුනුම් උපකරණ. (RFID)

ඉහත ඒවායින් කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ යෙදවුම් පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1. A, D, E
2. B, C, D
3. C, D, E
4. A, C, D

4.) පහත A තීරුව සමඟ B තීරුව ගලපන්න.

A	B
i) බ්ලේස් පැස්කල් (Blaise Pascal)	a) ප්‍රථම වැඩසටහන් ශිල්පිනිය.
ii) ජෝශප් ජැකුවාඩ් (Joseph Jacuard)	b) සිදුරුපත සංකල්පය.
iii) චාල්ස් බැබේජ් (Charles Babbage)	c) ආකලන යන්ත්‍රය (Adding machine)
iv) ඔගස්ටා ලව්ලේස් (Augasta Lovelace)	d) විශ්ලේෂන යන්ත්‍රය.

1. c, d, b, a
2. a, b, c, d
3. d, b, c, a
4. b, d, a, c

ictnotes.org

5.) තාක්ෂණය අනුව පරිගණක වර්ගීකරණයට අයත් නොවන්නේ,

1. සුපිරි පරිගණක.
2. ප්‍රතිසම පරිගණක.
3. සංඛ්‍යාංක පරිගණක.
4. මිශ්‍ර පරිගණක.

6.) පහත A තීරුවේ දැක්වෙන ආදාන උපාංග වලට ගැළපෙන පරිගණක කෙවෙනිය B තීරුවෙන් තෝරන්න.


A	B
• පරිගණක තිරය.	a) ශ්‍රේණිගත කෙවෙනිය. (Serial port)
• යතුරු පුවරුව.	b) සමාන්තරගත කෙවෙනිය. (Parallel port)
• මුද්‍රකය.	c) Ps/2 කෙවෙනිය.
• මොඩමය.	d) HDMI කෙවෙනිය.

1. A, B, C, D
2. D,C, B, A
3. C, A, B, D
4. B, C, A, D

7.) පරිගණක ජාලකරණයේදී අත්‍යාවශ්‍යම නොවන උපාංගය වන්නේ,

1. ජාලකරණ අතුරුමුහුණත් කාඩ්පත. (NIC)
2. මාර්ගකය. (Router)
3. ස්විච්චය. (Switch)
4. ගිනිපවුර. (Firewall)

8.) ඉහත ජාල ස්ථලය වන්නේ?



1. තරු (Star topology)
2. මුදු. (Ring topology)
3. දැල්. (Mesh topology)
4. ගස්. (Tree topology)

9.) පුරවර ප්‍රදේශ ජාලයක් වන්නේ?

1. පාසල් පරිගණක විද්‍යාගාර ජාලය.
2. කොළඹ නගරය තුළ ශාඛා සහිත “flora” ආයතනයේ පරිගණක ජාලය.
3. ලොවපුරා පිහිටි HSBC බැංකු ජාලය.
4. සබරගමුව පළාත් සභා කාර්යාල පරිගණක ජාලය.

10.) දශමය පාදයෙන් 57ට අසමාන වන්නේ,

1. 111001_2
2. 71_8
3. 29_{16}
4. 01010111_{bcd}

ictnotes.org

11.) පහත වගුව සලකන්න.

සංඛ්‍යාව	MSD	LSD
57.23	.....	.....

වැඩිම වෙසෙසි සංඛ්‍යාංකය හා අඩුම වෙසෙසි සංඛ්‍යාංකය පිලිවෙළින් අයත් පිළිතුර වන්නේ,

1. 5, 3
2. 7, 2
3. 3,5
4. 2, 7

12.) ධාරිතාවය අනුව අවරෝහණ පිලිවෙළට පහත ද්විතියික ආචයන සැකසූ විට,

A. දෘඩ තැටිය. (Hard disk)
B. සංඛ්‍යාංක බහුවිධ තැටිය. (Digital Versatile Disk)
C. සැනෙලි මතකය. (Flash memory)
D. සංයුක්ත තැටිය. (Compact Disk)

1. D, C, B, A
2. D, B, C, A
3. A, C, B, D
4. D, B, A, C

13.) " C " අක්ෂරය සඳහා ASCII කේතය 1000011 වන අතර " G " අක්ෂරය සඳහා ASCII කේතය වන්නේ,

1. 1000001
2. 1100111
3. 1001000
4. 1000111

14.) 512MB සසම්භාවී පිවිසුම් මතකයක ඇති බයිට (bytes) ගණන වන්නේ,

1. 2^{19} bytes.
2. 2^{20} bytes.
3. 2^{29} bytes.
4. 2^{30} bytes.

15.) යුනිකේත ක්‍රමයේ ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ,

A. බිටු 16 ක් භාවිතා කිරීම.
B. සිංහල, දෙමළ ඇතුළු භාෂා කිහිපයක් ඇතුළත් වී තිබීම.
C. විද්‍යුත් ලේඛණ විවිධ භාෂාවලට පරිවර්තනය කිරීම.

1. A පමණි.
2. B පමණි.
3. A, B, C සියල්ලම.
4. A සහ B පමණි.


16.) තාර්කික ද්වාර පිලිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.


1. ඉලෙක්ටොනික පරිපථ නිර්මාණය කොට ඇත්තේ මූලික තාරිකික පරිපථ රාශියක් සම්බන්ධ කිරීමෙනි.
2. තාරිකික ද්වාරයක් මගින් ඒ වෙත ලබාදෙන ආදාන සලකා බලා ප්‍රතිදානයක් ලබා දෙයි.
3. තාර්කික ද්වාර පරිපථ වල භාවිතා වන ආකාරය අනුව කොටස් තුනකය වෙන් කරයි.


ictnotes.org


4. AND, OR, NOT යනු මූලික තාර්කික ද්වාරයි.


17.) පහත විද්‍යුත් පරිපථයට තුල්‍ය තාරිකික ද්වාරය තෝරන්න.



1. 

2. 


3. 

4. 

18.) 9 ශ්‍රේණියේ සිසුවෙකු නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ තරඟ තෝරා ගැනීමේදී උස පැනීම (A), දුර පැනීම (B) යන ඉසව් දෙකෙන් එක් ක්‍රීඩාවක් සමඟ 100m (C) හා 200m (D) සඳහා සහභාගී වෙයි. මෙම අවස්ථාව නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

1. (A OR B) AND (C AND D)
2. (A OR B) OR (C AND D)
3. (A AND B) AND (C OR D)
4. (A AND B) OR (C OR D)

19. මෙහි නිවැරදි ප්‍රතිදානය වන්නේ,



1. (A.B) . (B.B)
2. (A+B) + (B.B)
3. (A+B) . $\overline{(B+B)}$
4. (A.B) + (B+B)

20.) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක (ATM) භාවිත කල හැකි මෙහෙයුම් පද්ධති වර්ගයකි.

1. බහු කාර්යය. (Multi tasking)
2. තත්‍ය කාල. (Real time)
3. ඒක පරිශීලක. (Single user)
4. බහු පරිශීලක. (Multi user)

21.) චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක මූලික සංරචක හඳුන්වන කෙටි යෙදුම වන්නේ,

1. WIMP
2. PMIW

ictnotes.org

3. IWMP
4. WIPM

22.) පංගු බෙදීම (Disk partitioning) පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,

1. පරිගණකයේ එක් මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කිරීමට.
2. දෘඩ තැටියේ වැඩි ඉඩ ප්‍රමාණයක් ලබා ගැනීමට.
3. පරිගණකයේ තැම්පත් කරනු ලබන දේවල් වෙන් වෙන්ව තැම්පත් කර ගැනීමට.
4. දෘඩ තැටියේ ගබඩා කර ඇති දෝෂ වෙනත් ස්ථානයකට රැගෙන යාම සඳහා.

23. මෙහෙයුම් පද්ධතිවල භාවිතා වන උපයෝගී වැඩසටහනක් නොවන්නේ,

1. කාර්යය කළමණාකරු. (Task management)
2. ගොනු/දත්ත සංකෝචනය. (Compress)
3. භාෂා පරිවර්තක. (Language translators)
4. තැටි සුපරීක්ෂනය. (Disk Scanning)

24.) ගොනු තැම්පත් කිරීමේදී එක ළඟ තැම්පත් නොකර අමතර ඉඩක් වෙන් කර තැබීම නිසා ප්‍රතිභාගීකරණය (Defragmentation) අවශ්‍ය නොවේ. මෙවැනි මෙහෙයුම් පද්ධතියකට උදාහරණයකි.

1. Linux.
2. Windows XP.
3. Windows 7.
4. MS Excel.

25. සේවාදායක පරිගණකවල ක්‍රියාකාරිකත්වය සඳහා ඇති මෙහෙයුම් පද්ධතියකි.

1. Windows Vista.
2. Windows XP.
3. MS Access.
4. MS Windows Server.

26.) වර්තමානයේ ජංගම උපාංගවල වදන් සැකසීම සඳහා යොදා ගන්නා විශේෂිත වදන් සැකසීමේ මෘදුකාංගයකි.

1. Google Docs.
2. Open Office Impress.
3. Open Office Calc.
4. Oracle.

27.) වදන් සැකසීමේදී පිටු සැකසුමෙහි දිශානති ආකාර 2 වන්නේ,

1. වම, දකුණ. (Left and right)
2. සිරස්, තිරස්. (Portrait and landscape)
3. මැද එකෙල්ල, දෙකෙළවර එකෙල්ල. (Center and justify)
4. වමෙන් අනුඡේදනය, දකුණෙන් අනුඡේදනය. (Left indentation and right indentation)

28.) වදන් සැකසුමේදී සෝදුපත් බැලීමට අදාළ ක්‍රියා ඇතුලත් පිළිතුර වන්නේ,

1. අක්ෂර වින්‍යාසය, වචන සෙවීම හා ප්‍රතිස්ථාපනය, ශබ්ද නිධිය.

ictnotes.org

2. මුද්‍රණ පෙර දසුන, වචන සෙවීම හා ප්‍රතිස්ථාපනය, තැපැල් මුසුව,
3. තැපැල් මුසුව, අක්ෂර වින්‍යාසය, ශබ්ද නිධිය.
4. ශබ්ද නිධිය, හැඩතල, වචන සෙවීම හා ප්‍රතිස්ථාපනය.

29.) ලේඛන සැකසුමේදී වගු සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

1. කෝෂ කිහිපයක් සංයුක්ත කළ හැක.
2. කෝෂ කිහිපයක් මකා දමා එක් කෝෂයක් කළ හැක.
3. වගුවට පාට හෝ විලාසයක් ලබා දිය හැක.
4. වචන දිශානතිය වෙනස් කළ හැක.

30.) What is the formatting used in following document?

1.Word Processing
1.1 Software
1.2 MS Word
1.2.1 Interface
1.2.2 Toolbar

1. Bullet list.
2. Number list.
3. Multi-level list.
4. Border.

31.) පහත මෘදුකාංග අතරින් විද්‍යුත් පැතුරුම්පත් (Electronic Spreadsheet) මෘදුකාංගයක් නොවන්නේ,

1. Microsoft Excel.
2. Libre Office Calc.
3. Libre Office Impress.
4. Open Office Calc.

❖ ප්‍රශ්ණ අංක 32 හා 33 සඳහා මෙහි දක්වා ඇති පැතුරුම්පත් කොටස පාදක වී ඇත.

	A	B	C	D
1	15	60		
2	25	70		
3	35	50		
4	40	10		
5				

32.) A1:B4 කෝෂ පරාසය තුළ ඇති විශාලම සංඛ්‍යාව පෙන්වීමට A5 කෝෂයේ ලිවිය යුතු නිවැරදි සූත්‍රය (formula) කුමක්ද?

1. =sum(A1:B4)
2. =Max(A1:B4)
3. =Min(A1:B4)
4. =Rank(A1:B4)

ictnotes.org

33.) A1:B4 කෝෂ පරාසය තුල ඇති සංඛ්‍යා සහිත මුළු කෝෂ ගණන ලබා ගැනීමට B5 කෝෂයේ ලිවිය යුතු නිවැරදි සූත්‍රය (formula) කුමක්ද?

1. =Sum(A1:B4)
2. =Max(A1:B4)
3. =Count(A1:B4)
4. =Rank(A1:B4)

34.) පැතුරුම්පත් කෝෂයකට = (3*5)^2 යන සූත්‍රය ඇතුලත් කරන ලදී. කෝෂයේ දිස්වෙන අගය කුමක්ද?

1. 225
2. 45
3. 30
4. 75

35.) විද්‍යුත් සමර්පණ (Presentation) මෘදුකාංග වලට විශේෂිත වූ කාර්යන් පහත සඳහන් දෑ අතරින් මොනවාද?

A. කදාවකින් කදාවකට සංක්‍රමණ විලාස ඇතුළත් කිරීම. (Inserting slide transition)
B. සජීවීකරණ ඇතුළත් කිරීම. (Inserting Animation)
C. තැපැල් මුසුව. (Mail Merge)
D. ශබ්ද ඇතුලත් කිරීම. (Inserting sound)

1. A සහ B පමණි.
2. A සහ D පමණි.
3. C සහ D පමණි.
4. A, B සහ D පමණි.

36.) විද්‍යුත් සමර්පණ (Presentation) මෘදුකාංග තුළ සමර්පණයේ අඩංගු සියළුම කදා කුඩාවට පෙන්වනු ලබන්නේ කුමන දසුනෙන්ද?

1. සාමාන්‍ය දසුන. (Normal view)
2. ස්ලයිඩ සුබෙදුම් දසුන. (Slide sorter view)
3. කියවුම් දසුන. (Reading view)
4. සමර්පණ රාමු දසුන. (Slide show view)

37.) පාසල පිළිබඳව ඉදිරිපත් කිරීමක් (Presentation) පිළියෙල කරන්නේ යැයි උපකල්පනය කරන්න. ඉදිරිපත්කිරීම් මෘදුකාංගයක් (Presentation Software) භාවිතා කර, ඔබේ ඉදිරිපත් කිරීමෙහි,

A. පාසලේ ජායාරූපයක්. (Image)
B. පාසල් ගීතයේ ශබ්ද පසුරක්. (Audio clip)
C. පාසල පිළිබඳ දෘෂ්‍ය පතුරක්. (Video clip)
D. පාසලේ වෙබ් පිටුවට පිවිසීමට අධිසන්ධානයක්. (Hyperlink)

යන ඒවා අතරින් කවර ඒවා අඩංගු කළ හැකිද,

1. A, B සහ D පමණි.
2. B, C සහ D පමණි.
3. A, B, C, D සියල්ලම.
4. කිසිවක් නොවේ.

ictnotes.org

38.) පාසලේ ශිෂ්‍ය තොරතුරු ඇතුළත් දත්ත සමුදාය වගුවක පහත දැක්වෙන ශිෂ්‍ය ඇතුළත් වීමේ අංකය සහා වඩාත් සුදුසු දත්ත ප්‍රරූපය කුමක්ද?

1. සංඛ්‍යාත්මක. (Numeric)
2. පාඨ. (Text)
3. මුදල්. (Currency)
4. බූලියන්. (Boolean)

❖ ප්‍රශ්ණ අංක 39 හා 40 ට පිළිතුරු දීම සඳහා පාසල් පුස්තකාලය භාවිතා කරන පහත දැක්වෙන දත්ත සමුදාය වගුව සලකන්න.

පරිග්‍රහණ අංකය	පොතේ නම	කතෘ නාමය	ඒකක ගණන
23375	ගණිත සංකල්ප	A.A.පෙරේරා	23
23376	තො.තාක්ෂණය	A.මහින්ද සිල්වා	40
23377	විද්‍යා මූලධර්ම	C.අතුකෝරල	37

39.) වගුවේ ඇති එක් පොතකට අදාළ සියළුම දත්ත හඳුන්වන්නේ කුමන නමකින්ද?

1. ක්ෂේත්‍රයක්. (Field)
2. විමසුමක්. (Key)
3. විමසුමක්. (Query)
4. වාර්තාවක්. (Report)

40.) වගුවේ ඇති ක්ෂේත්‍ර ගණන කොපමණද?

1. 4
2. 3
3. 12
4. 16

ictnotes.org

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2016 **10 ශ්‍රේණිය**

மூன்றாம் தவணைப் பரீட்சை **2016** தரம் **10**

Third Term Test 2016 **Grade 10**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I I

தகவல் மற்றும் தொடர்பாடல் தொழிநுட்பம் I I

Information and Communication Technology I I

පැය දෙකයි

Two hours


மூன்று மணித்தியாலம்

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 20ක්ද අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහාම ලකුණු 10 බැගින්ද හිමිවේ.

---

1)

I. පහත දැක්වෙන රූප සටහන මගින් විශාලත්වය අනුව පරිගණක වර්ග කිරීමක් නිරූපණය වන්නේ නම් A, B, C හා D සඳහා උචිත පදයන් ලියන්න.



A .....

B .....

C .....

D .....

II. ප්‍රථම වරට චිත්‍රක පරිශීලක අතුරුමුහුණතක් සහිත මෙහෙයුම් පද්ධතියක් ඇති පරිගණකයක් දැකිය හැකි වන්නේ කුමන පරම්පරාවේද?

III. සංස්කරණය කළා වූ තොරතුරු පරිගණක පද්ධතියක් තුළින් පිටතට ලබා දෙන ආකාර (Output) 3 ලියන්න.

IV. $15D_{16}$ යන ෂඩ් දශමය සංඛ්‍යාව දශමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න. (පියවර ලියා දක්වන්න.)

V. පහත A වගුවෙහි විස්තර කරන දේ සඳහා උදාහරණ B වගුවෙන් තෝරන්න. (1, 2, 3, 4 හි පිළිතුරට අදාළ අක්ෂරය ලිවීම ප්‍රමාණවත් වේ.)

A	
1	විවෘත මෘදුකාංගයකි.
2	ලොව පළමු යාන්ත්‍රික ගණක යන්ත්‍රය.
3	වඩා දීප්තිමත් පරිගණක තිරය.
4	ඝන තත්වයේ මතක උපාංගයකි.

B	
A	Adding Machine.
B	Hanthana Linux.
C	Secure Digital Card.
D	Light Emitting Diaode.

VI. තොරතුරු හුවමාරුවේදී නාභිය ක්‍රියාත්මක වන්නේ ..... විධි ක්‍රමයට වන අතර, ස්විචය ..... විධි ක්‍රමයට ක්‍රියා කරයි. (හිස්තැනට සුදුසු පද ලියන්න.)

VII. $\overline{(\bar{A}.C)} + B$ යන බූලීය වීජ ප්‍රකාශනයට අදාළ තාර්කික පරිපථය අඳින්න.

ictnotes.org

VIII. = 16/4*5-2^3+8 මෙම සූත්‍රය පැතුරුම්පත් කෝෂයක් තුළ යතුරු ලියනය කිරීමෙන් ලබා ගත හැකි පිළිතුර කුමක්ද?

IX. දත්ත සමුදාය කළමණාකරනයේදී දත්ත සමරික්තතාව (Data Redundancy) ලෙස හැඳින්වෙන්නේ කුමක්ද?

X. මූලික තාර්කික ද්වාර සම්බන්ධ කිරීමෙන් සාදන සංයුක්ත තාර්කික ද්වාර 2ක් ලියන්න.

2.)

I. 79_{10}, 385 යන දශමය සංඛ්‍යා ද්විමය, අෂ්ටමය හා ෂඩ් දශමය පාදවලට හරවන්න. (පියවර ලියා දක්වන්න.) (ල.3)

II. සේවාදායක පරිගණක කාමරයට ඇතුලත් වීම සඳහා ආරක්ෂක පද්ධතියක් සවිකර ඇත.එහි දොර විවෘත කිරීම සඳහා ප්‍රධාන ජාල පාලකගේ ඇඟිලි සළකුණ (A) හෝ පළමු නියෝජ්‍ය ජාල පාලක (B) සහ දෙවන නියෝජ්‍ය ජාල පාලක (C) යන දෙදෙනාගේ ඇඟිලි සළකුණු දෙක ලබා දිය යුතුය.


ඇඟිලි සළකුණ ලබා දීම	1
ඇඟිලි සළකුණ ලබා නොදීම	0
දොර විවෘත වීම	1
දොර විවෘත නොවීම	0

a) ඉහත කාර්ය සඳහා තාර්කික පරිපථය අඳින්න. (ල.3)

b) ඉහත තාර්කික පරිපථය සඳහා සත්‍යතා වගුව නිර්මාණය කරන්න. (ල.4)

iii.

3.) පහත දැක්වෙන්නේ පරිගණක අලෙවි සැලක ප්‍රචාරණ දැන්වීමකි.



ictnotes.org

I. A, B, C, D අක්ෂර වලින් පෙන්වා ඇති ආකාරයට සකස් කර ගැනීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගයේ ඇති පහසුකම් මොනවාද? (ල.2)

II. වදන් සැකසුම් නිදහස් හා විවෘත මෘදුකාංග (Free and Open source) 2ක් නම් කරන්න. (ල.2)

III. මෙම දැන්වීම කිහිපදෙනෙකුට යැවීම සඳහා ලියුම් කවර සකස් කිරීමට වදන් සැකසුම් මෘදුකාංග වල දී ඇති පහසුකම කුමක්ද? (ල.2)

IV. ඔබගේ පරිගණකයේ වදන් සැකසුම් මෘදුකාංගයක් ස්ථාපිත කර නැත්නම් අන්තර්ජාලය භාවිතයෙන් ඉහත ලේඛණය නිර්මාණය කර ගැනීමට යොදාගත හැකි මෘදුකාංග 2 නම් කරන්න. (ල.2)

V. ඉහත දැන්වීම පරිගණකයේ page 03 ලෙස තැම්පත් කළ විට තැම්පත් වන්නේ කුමන ගොනු දිගු නාමයෙන්ද? (ල.2)

4.) පහත දැක්වෙන්නේ එක්තරා පාසලක 10 ශ්‍රේණියේ සිසුන්ගේ 2 වන වාර විභාගයේ ලකුණු ඇතුලත් පැතුරුම්පත් කොටසකි.

	A	B	C	D	E	F	G
1	Name	Maths	ICT	Science	Total	Average	Rank
2	Nimal	80	85	69			
3	Amal	67	90	70			
4	Saman	70	80	81			
5	Kamal	80	75	78			
6	Asiri	85	80	71			
7	Min						
8	Max						

I. ඉහත වගුවේ නිමල්ගේ විෂයන් සඳහා ලබාගත් ලකුණු වල එකතුව E2 කෝෂයට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය නිවැරදි ශ්‍රිතය (formula) දක්වන්න. (ල.2)

II. E2 කෝෂයට ඇතුලත් කර ඇති ශ්‍රිතය (formula) E3 කෝෂයට පිටපත් කල විට එම සූත්‍රය E3 කෝෂයෙහි පෙන්නුම් කරන්නේ කෙසේද? (ල.2)

III. ICT විෂය සඳහා ශිෂ්‍යයන් ලබාගත් අඩුම අගය C7 කෝෂය සඳහා ලබා ගැනීමට යොදාගත හැකි ශ්‍රිතය කුමක්ද? (ල.2)

IV. එක් එක් ශිෂ්‍යයා විෂයන් සඳහා ලබාගත් ලකුණු පෙන්වීමට යෝග්‍ය වන පැතුරුම්පත් මෘදුකාංගයේ ඇති ප්‍රස්ථාර වර්ගය (Chart type) යෝජනා කරන්න. (ල.2)

ictnotes.org

V. මෙබඳු ගණනය කිරීම් සඳහා පැතුරුම්පත් මෘදුකාංගයක් යොදා ගැනීමේ වාසි 4ක් ලැයිස්තුගත කරන්න. (ල.2)

5.)

i) පරිගණකයක අත්‍යාවශ්‍යම මෘදුකාංගය මෙහෙයුම් පද්ධතියයි. ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දෙකක් ලියන්න.(ල.3)

ii) පරිගණක පද්ධතියක දෘඩාංග පාලනය කිරීම සඳහා භාවිතා වන කළමණාකරනයන් 4ක් ලියන්න. (ල.2)

iii) පහත මෙහෙයුම් පද්ධති සඳහා භාවිතා වන ගොනු ආකෘති තෝරා ලියන්න. (ල.3)
(NTFS, FAT16, ext4)

1. MSDOS
2. Windows 8
3. Ubuntu

iv) පහත ගොනු හා ෆෝල්ඩර් මෙහෙයුම්, අදාළ පිළිවෙළට නොමැත. එහි නිවැරදි පිළිවෙළ ඉංග්‍රීසි අක්ෂර පමණක් ලියා දක්වන්න.

A. පිටපත් කල යුතු ධාවකයන්
B. Paste විධානය ලබාදෙන්න.
C. පියපත් කළ යුතු ගොනුව/ෆෝල්ඩරය තෝරාගන්න.
D. පිටපත් කිරීමට copy විධානය ලබා දෙන්න.

6.) Road king බස් සමාගමේ බස් රථ සහ සේවකයන් පිළිබඳ තොරතුරු ඇතුලත් දත්ත සමුදායක් පහත දැක්වේ. එයට අදාලව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

Bus වගුව

Bus No	Seats	Route-No	Route- Name
NP5000	52	122	COL - RAT
NP5001	40	470	AVI-RAT
NP5002	52	490	EMB-RAT
NP5003	40	450	PAN-RAT

Driver වගුව (රියදුරු වගුව)

DR_NAME	DR_ID	BUSNO
Saman	7580	NP5000
Nimal	6095	NP5001
Kamal	2009	NP5002
Saman	6609	NP5000
Jeewan	3051	NP5002

ictnotes.org

Conductor වගුව (කොන්දොස්තර වගුව)

CON_NAME	CON_ID	BUSNO
Ranil	8021	NP5000
Sunil	7129	NP5003
Ruwan	5201	NP5001
Sisira	5900	NP5002
Ravimal	5921	NP5003

i) වගු තුන සඳහා ප්‍රාථමික යතුරු වගුවේ නම සමඟ ලියන්න. (ල.3)

ii) ඉහත ආයතනය දත්ත සමුදාය සඳහා එක් වගුවක් භාවිත කළේ නම් මුහුණ පාන අපහසුතා 2ක් ලියන්න. (ල.2)

iii) Road king සමාගමේ අයිතිකරු නව බස් රථයක් මිලදී ගත්තේය. ආසන 52ක් සහිත ඇඹිලිපිටිය - රත්නපුර මාර්ගය සඳහා එය යොදා ගනී.

A. කුමන වගුව යාවත්කාලීන කල යුතුද?

B. යාවත්කාලීනන කිරීමට අදාල රෙකෝඩය ලියා දක්වන්න. (ල.3)

iv) ඉහත ආකාරයේ දත්ත සමුදාය සැකසීම සඳහා භාවිතා තල හැකි මෘදුකාංග 2ක් ලියන්න. (ල.2)

ictnotes.org